" විශිෂ්ඨ රාජ්‍ය සේවාවක් සඳහා ඇප කැපවෙමු "

# ප්‍රධාන ලේකම් කාර්යාලය - බස්නාහිර පළාත
# பிரதான செயலாளர் அலுவலகம் - மேல் மாகாணம்
# OFFICE OF THE CHIEF SECRETARY - WESTERN PROVINCE

204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
204, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்ல.
204, Denzil Kobbekaduwa Mawatha, Battaramulla.

ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary } දුරකථන / தொலைபேசி / Telephone - 011 - 2092599
ෆැක්ස් / பெக்ஸ் / Fax - 011 - 2092601
ඊ-මේල් / மின்னஞ்சல் / E-mail - chiefsecretary@wpc.gov.lk

පොදු දුරකථන / தொலைபேசி இலக்கம் / General Telephone } 011 - 2093000

SLSI SYSTEM CERTIFIED ISO 9001 · SLAB ACCREDITED ISO/IEC: 17021 QMS-001-01

| මගේ අංකය / எனது இலக்கம் / My No. | CSWP/ADM/18-38/FI/02-2023 | ඔබේ අංකය / உமது இலக்கம் / Your No. | | දිනය / திகதி / Date | 2023.07. 28 |
|---|---|---|---|---|---|

ලේකම්, සෞඛ්‍ය අමාත්‍යාංශය (බ.ප.),
ලේකම්, පළාත් පාලන අමාත්‍යාංශය(බ.ප.),
පළාත් පාලන කොමසාරිස් (බ.ප.),
පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ (බ.ප.),
ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ - කොළඹ,
ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ - කළුතර,
ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ - ගම්පහ,

**සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම්ගේ පොදු චක්‍රලේඛ අංක 01-40/2022 අනුව, වෛද්‍ය කර්මය සඳහා වූ පරිපූරක වෘත්තීන්ගේ සේවාවේ I ශ්‍රේණියේ නිලධාරීන් විසින් තෙවැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයට පෙනී නොසිටීම හේතුවෙන් වැටුප් වර්ධක නතර කිරීමට අදාළව සහනයක් ලබා දීම.**

උක්ත කරුණ සම්බන්ධයෙන් බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්ගේ අංක WPC/PSC/ADM02/04/04 හා 2023.07.06 දිනැති ලිපියෙන් ලැබී ඇති අනුමැතිය අනුව මෙම කාණ්ඩවලට අයත් බස්නාහිර පළාත් සභාව යටතේ සේවයේ නියුතු නිලධාරීන් සම්බන්ධයෙන් පහත පරිදි කටයුතු කරන මෙන් කාරුණිකව දන්වමි.

I. වෛද්‍ය කර්මය සඳහා වූ පරිපූරක වෘත්තීන්ගේ සේවාවට අයත් නිලධාරීන්ට 3 වන කාර්යක්ෂමතා කඩඉම සම්පූර්ණ කිරීම සඳහා 2023.12.31 දින දක්වා සහන කාලයක් ලබාදීමට සහ එදින දක්වා පමණක් නියමිත වැටුප් වර්ධක ගෙවීමට

II. 2023.12.31 දිනයෙන් පසුව යෙදෙන වැටුප් වර්ධකයන් 3 වන කාර්යක්ෂමතා කඩඉම සමත් වන නිලධාරීන් සඳහා පමණක් ගෙවීමට

III. 3 වන කාර්යක්ෂමතා කඩඉම් විභාගයට අදාල සංශෝධන සඳහා වන යෝජනා රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර අනුමැතිය ලබා ගන්නා තෙක් දැනට අනුමත විධිවිධාන අනුව 2023.12.31 දිනට පෙර තෙවැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයට පෙනී සිටීමට සහ සමත් වීමට

02. මෙම විධිවිධාන පිළිබඳව සියළු පාර්ශව දැනුවත් කිරීමට ද කටයුතු කරන මෙන් වැඩිදුරටත් දන්වමි.

ප්‍රදීප් යසරත්න,
ප්‍රධාන ලේකම්,
බස්නාහිර පළාත.

පිටපත : ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව (බ.ප.) - කරු.දැ.ගැ.ස.